සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/Audit

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2023.02.02

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කලමනාකරුවන් වෙත.**

**<u>විගණන මත සමඟ ඉදිරිපත්කර ඇති නිරීක්ෂණ වාර්තා සඳහා පිළිතුරු ලබා ගැනීම.</u>**

සියලුම ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති වෙත 2016, 2017, 2018, සහ 2019 වර්ෂ සඳහා අභ්‍යන්තර විගණන අංශය මගින් විගණන මත නිකුත් කිරීම මේ වන විට අවසන් කර ඇත.

02. ඉහත වර්ෂ වලට අදාළ විගණන මත සහ නිරීක්ෂණ වාර්තා අභ්‍යන්තර විගණන අංශය මගින් **අදාල ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති වෙත හා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ විගණන අංශය වෙත** දැනටමත් ඊමේල් මගින් යොමු කර ඇත. එබැවින් ඔබගේ විද්යුත් තැපැල පරීක්ෂා කර, අදාල වාර්තා ලබාගැනීමට කටයුතු කරන ලෙසත්, වාර්තා ලැබී නොමැති නම් ඒ සම්බන්ධව ඔබගේ **දිස්ත්‍රික් විගණන අංශය භාර විගණන නිලධාරි වෙත** දැනුම් දෙන ලෙසත් දන්වමි.

03. විගණන මතය සමග යොමු කර ඇති නිරීක්ෂණ වාර්තාව ඔබ වෙත ලැබී දින 14 ක් ඇතුලත ඒ සඳහා පිළිතුරු ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු කිරීමට දන්වා ඇති අතර, ඒ අනුව කටයුතු කරන ලෙස දන්වමි.

04. තව ද, ඉහත **වර්ෂයන්ට අදාල ලාභ විසර්ජනයන් ප්‍රයෝජනයට ගැනීම සඳහා අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය ) ගේ ලිඛිත අවසරය ලබා ගත යුතු අතර,** ඒ සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

**(අ) <u>ප්‍රජාමූල බැංකුවට අදාල නිරීක්ෂණ වාර්තා ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත යොමු කිරිම.</u>**

අදාල නිරීක්ෂණ වාර්තා බැංකු සමිති කළමනාකරු පුද්ගලිකව පරීක්ෂා කර, නිවැරදි කල බවට සහතික කර, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව **දිස්ත්‍රික් සමෘද්ධි අංශයට යොමු කල යුතුය.** ඉන් අනතුරුව **දිස්ත්‍රික් විගණන නිලධාරීගේ තහවුරුවෙන් අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත එවීමට කටයුතු කල යුතුය.**

**(ආ) <u>ප්‍රජාමූල බැංකු සමිතියට අදාල නිරීක්ෂණ වාර්තා ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත යොමු කිරීම.</u>**

අදාල නිරීක්ෂණ වාර්තා ප්‍රාදේශීය ලේකම් හෝ බලයලත් නිලධාරියෙකු පෞද්ගලිකව පරීක්ෂා කර, නිවැරදි කල බවට සහතික කර, **දිස්ත්‍රික් සමෘද්ධි අංශයට යොමු කල යුතුය. ඉන් අනතුරුව දිස්ත්‍රික් විගණන නිලධාරීගේ තහවුරුවෙන් අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත එවීමට කටයුතු කල යුතුය.**

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 288772 |

මෙම ලිපියේ සඳහන් කරුණු කෙරෙහි ඔබගේ සහ කාර්ය මණ්ඩලයේ අවධානය යොමු කරන ලෙසත්,මෙම උපදෙස් අනුව කටයුතු කර කොටස්කරුවන්ට ලාභාංශ ප්‍රකාශ කිරීම ඇතුළු අනෙකුත් විසර්ජන කටයුතු කඩිනමින් සිදු කර ගැනීමට සහයෝගය ලබා දෙන ලෙසත් කාරුණිකව දන්වමි.

**සැ.යු. නිරීක්ෂණ වාර්තා වලට පිලිතුරු ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත පහත ලිපිනයට යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.**

**අධ්‍යක්ෂ(ක්ෂුද්‍ර මූල්‍ය),**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**4 වන මහල,**
**සෙත්සිරිපාය (1 අදියර),**
**බත්තරමුල්ල.**

**එස්.ඒ.එස්.වික්‍රමසිංහ,**
**අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය ( වැ.ආ ).**
**අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.**

පිටපත්-:

1. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
2. සියලුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ගැ.ස.
3. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ගැ.ස.